# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1964/11 - 2016 අප්‍රේල් මස 26 වැනි අඟහරුවාදා - 2016.04.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78(xii)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27(1) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2015 මාර්තු 16 දින අංක 1906/6 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන් වරට සංශෝධිත) එකී පනතේ 21 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ 1 වැනි තීරයේ ''පීඨ'' යන ශීර්ෂය යටතේ සඳහන් ''කලා සහ සංස්කෘතික පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ II වැනි තීරයේ ''අධ්‍යයන අංශය'' යන ශීර්ෂය යටතේ සඳහන් (ඇ) යන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් 1996 මාර්තු 27 දින අංක 916/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමයේ II වැනි උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''(ඉ) ආර්ථික විද්‍යාව හා සංඛ්‍යානය අධ්‍යයනාංශය''.

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 අප්‍රේල් මස 25 වැනි දින,
කොළඹ දී ය.

05-201

1A - PG 2935— 508 (2016/04) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*